

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

## කෝන් හෙවනෙ බුදු වේවා අප්පුච්චා අද

මම අවශ්‍ය දේ ලක ලෑස්ති කරලා අහවර වෙන්ටත් කලියෙන් කොයින් මාමා අමුතු විදියට හිනා කොරාන ට්‍රැක්ටරයට ගොඩ වුණා.

"මොනෑ මාමා උඹ පොදි ගහන් ආවෙ..?"

"ඒවැයින් කාරියක් නැතුවා.. බොගේ කාරිය අහවර නම් කලුවර කඩා වැටෙන්ට කලින් යම.. මේකලත් අඩුම කුඩුම හොයාන හේන් ඉමෙන් එහාට ගාටනවා.." කොයින් මාමා කියන්නෙ ඉඩු පොදි වගයක් උස්සාන ගාටන ගමේ මිනිස්සු කීප දෙනෙක් දිහා බලමින්.

"මාමා ඉර ගිලෙන්ටත් ළඟයි නොවැ.. කියාපන් මේකට ගොඩ වෙන්ට.. මං ඕකලාව කුරුලු මැණ්ඩිය ළඟට දොක්කන්-නං.."

"අඩා විගැහින් ගොඩ වෙයව්.. තොපිට කුරුළු මැංඩිය ළඟින් පැන ගන්ට පුලුවන්.."

පොරකමින් ට්‍රැක්ටරයට නගින ගැමියන්ට කොයින් මාමා තරවටු කරන ආකාරයෙන් මෙසේ කී ය.

"තියෙන අඩුම කුඩුම පොඩි පට්ටම් නොකර සීරුවට නැග ඉඳපියව්.."

මා ට්‍රැක්ටරය පණ ගන්වා මද දුරක් යන විට නැවතත් කොයින් මාමා කටහඬ අවදි කළා.

"අතේ තියෙන කාසි පණම් සේරම අහවර කර ගත්තද.?"

"නෑ මාමා.. "

"හෙනං මේ හරුබස්සම කොණ්ඩයා නිකං දුන්නා..?"

"ඒවායින් කාරියක් නෑ මාමා.. විගැහින් යමු.." මම ට්‍රැක්ටරයේ වේගය වැඩි කළෙමි.

"ඕං ඒ පාර මදයා ගාණට අඹන්ට තියාගත්තා.. හැල්මේ යම.." කොයින් මාමා කියන්නෙ මවාගත්ත තරහවකින්. කතාවෙන් කතාවෙන් අපි කුරුළු මැණ්ඩියටත් ආවා.

"ඕං මාමා ඕකලාට පැනගන්ට කියපන් විජැහින්.."

"අඩා පැනගනියව් විජැහින් තොපේ ලට්ට ලොට්ටත් අතගෙන.."

ාමිතාක් දුර ට්‍රැක්ටරයේ නැගී ආ පිරිස බිමට බැහැගන්නෙ මේ දුර එක්ක ආවාට අපට පින් දෙමින්.

"මලයන්ඩි බොට කැලේ දෙයියන්නෙ පිහිටයි.. අපි මේ ඉමෙන් රූටනවා.. පරිස්සමට ගිඩි ගිඩිය දක්කපිය.."

"හොඳා මාමා ... කලුව පාත් වෙන්ට කලින් විජැහින් පලයල්ලා.. කොයින් මාමා.. අපි වැවට කිට්ටු කරලා දිය නාගෙනම යමු.."

"ඒක යසයි.."

දිය නාගෙන පුලුවන් තරම් ඉක්මනට පැලට ගොඩවුණ ගමන්ම මාමා මැණිකාට අඬගෑවා.

"කෙළී විගැහින් ඔය තියෙන දෙයක් රත් කරලා හරි කර.. අපේ මහතැන්ට එමට කඩෙත්තුව ඇති.. ඔහෙන් ඇනබාගන් මං පොල්කටුව ගේනකං.. කර ඇරපිය මේකෙ ඇබේ.." කියේන් මාමා සැර බීම බෝතලයක් මා දිහාට දික් කරමින් කිව්වා.

"කැලේ දෙයියන්ට ඔප්පු වෙච්චාවෙ මේන් බල මැණිකා මුන්දෑ සැර බීම බෝතලයක් ගෙනැත්.. මාමා මේකයි එහෙනං උඹ පොදි කොරාන උන්නෙ.."

"විගැහින් ඩිංගිත්තක් වක්කරපං මේකට.."

උන්දෑ සැර බීම ටික එක හුස්මට ගිල දමා රැල් බුරුල් හැර මා ළඟින්ම වාඩි වුණේ මේ පද පේලිය හරිම ලස්සනට දිගේලි කරමින්.

*වාං ඇලේ පා කරමින් දාඩිය ලේ කඳ*
*හේන් ඉමේ හටන් කරපු මාර සෙනග බිඳ*
*යාං වෙච්ච කිරි කුරහන් යායේ හරි මැද*
*කෝන් හෙවනෙ බුදු වේවා අප්පුච්චා අද*

වනාන්තරයක ජීවත් වුණත් තම දෙමාපියන්ට බුදුන්ට සේ ගරු සත්කාර කිරීම කොතරම් අගේද? මහ ඉහළින් විබාග සමත් වුණ දවස පුරා ධර්ම දේශනා වලට සවන් දෙන නගරයේ ජීවත්වන අය අතර නැති වටිනා ගති ගුණ වලින් හෙබි මේ කැලෑබද මිනිසුන් මෙලෙසම බොහෝ කාලයක් නාගරීකරණයට ලක් නොවී ජීවත් වේවා යි මම සිතින් පැතුවෙමි.

බෝගල

**"බෝගල ගේ කතා"** දැන් තිසර ගුවන් විදුලියේ
www.sannasa.net ඔස්සේ හෝ ඔබේ දුරකතනයෙන් තිසර හා එක්වන්න

EASE YOUR TAX BURDEN, ENHANCE YOUR WEALTH

SANDAL
TAX ADVISORS PTY LTD

- TAX RETURNS
- ACCOUNTING AND BOOKKEEPING
- TAX PLANNING
- BAS AND IAS
- BUSINESS AND COMPANY REGISTRATION
- SELF-MANAGED SUPER FUND ACCOUNTING
- SET UP COMPANY, TRUST & SMSF
- FBT, WORK COVER, PAYROLL TAX, SUPERANNUATION
- BUSINESS CONSULTING

Amal Ramyanath
CPA, ACA, MBA & B.Sc
Registered Tax agent

SANDAL
SANDAL BUSINESS SOLUTIONS PTY LTD

GUSS DESIGN 9769 0099

- BUSINESS SERVICES
- PROJECT REPORTS
- BUDGET & CASH FLOW PREPARATION
- BODY CORPORATE ACCOUNTING
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS PROCESS MANAGEMENT
- PROJECT EVALUATION & MANAGEMENT
- SET UP ACCOUNTING SOFTWARE
- FINANCIAL & MANAGEMENT REPORT
- BUSINESS RESTRUCTURING
- LABOUR HIRING

Namal Gomes
B.Sc. (Acct), MBA (Sri. J), ACA, ASCMA
sandalsolutions@gmail.com

PROFESSIONAL, FRIENDLY & PERSONALIZED SERVICE

66 Princess Highway
Dandenong VIC 3175
Tel 8707 5542
Mob 0451 698 725

Branch - 31 Madeline St Glen Waverley VIC 3150
Tel 8802 8818 Mob 0412 775 889 Email sandalmanagement@optusnet.com.au